**ශීර්ෂය 159 - සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

------------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 159 - සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරන විගණන වාර්තාව 2016 අගෝස්තු 22 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

--------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

--------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 169.05 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 64.52 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 104.53 ක් හෙවත් සියයට 61.83 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 56.00 | 43.33 | 12.67 | 22.63 |
| මූලධන | 113.05 | 21.19 | 91.86 | 81.26 |
| එකතුව | 169.05 | 64.52 | 105.53 | 61.83 |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 15901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 3.00 | 1.67 | 0.02 | 1.10 | 18.00 | 5.75 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.138,859 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0002/0151/000 | 54,000 |
| 6000/0000/00/0013/0105/000 | 1800 |
| 6000/0000/00/0016/0096/000 | 83,059 |
| එකතුව | 138,859 |

## 2.4 විගණන නිරීක්ෂණය

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමණාකරන විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණ වලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමණාකරන විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------------

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-------------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
| --- | --- | --- |
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

### 3.2 විගණන සාක්ෂි නොවීම

------------------------------

වැය විෂයයන් 23 ක අදාළ වියදම් ගිණුම්ගත කළ මාරු පත්‍ර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-------------------------------------------

#### 3.3.1 අභ්‍යන්තර විගණනය

--------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

#### 3.3.2 විගණන හා කළමනාකරණ කමිටුව

-------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර එකක් පමණක් පවත්වා තිබුණි.

#### 3.3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

-------------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

-------------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

**-------------------------------------------------------------**

වෙනත් අමාත්‍යාංශ 05 කට හා ආයතනයකට ලියාපදිංචි අයිතිය හිමි වාහන 12 ක් සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණි.

## 3.5 අනුකූල නොවීම්

**------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණ වලදි නිරීක්ෂනය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 1646 | අමාත්‍යාංශය සතු සංචිත වාහනවල මාසික සාරාංශ වාර්තා සහ දෛනික ධාවන සටහන් සෑම මාසයක් අවසාන වී ඊ ළඟ මාසයේ 15 දිනයට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645(අ) | ක්‍රමවත් ලෙස සහ විධිමත් ලෙස වාහන ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 104(3) | වාහන අනතුරක් සිදු වූ විට පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයක් සිදු වන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්,එසේ කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| (i) 1980 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | සෑම මාස 06 කට වරක්ම වාහනවල දැවෙන ඉන්ධන ප්‍රමාණය පරීක්ෂා කර නොතිබුණි. |
| (ii) 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන චක්‍රලේඛය | රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 3.6 කාර්යය සාධනය

**-----------------**

2015 ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

**-------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් අංශ 08 ක් යටතේ දක්වා තිබුණද, පළාත් නවයෙහි සංචාරක කටයුතු සංවර්ධන කිරීම සඳහා වන කටයුත්ත පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම අමාත්‍යාංශයේ කාර්යයන් වුවද, 2015 වර්ෂයේදි ක්‍රියාත්මක වූ ව්‍යාපෘති පසු විපරම් කිරීමක් හෝ ඇගයීමට හෝ ලක් කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි, පළාත් නවයට ඇතුළත් වන ව්‍යාපෘතීන් 27 ක් සහ අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘතීන් 03 ක් වශයෙන් ව්‍යාපෘතීන් 30 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණද, ඉන් ව්‍යාපෘති 17 ක් 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.7 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 14 | 11 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 |
| (iii) | ද්විතියික මට්මට | 28 | 21 | 07 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 19 | 17 | 02 |
| | එකතුව | 65 | 50 | 15 |